දෙපාර්තමේන්තු චක්‍රලේඛ 2010/ 30

මගේ අංකය - බ/12/01/001/වා.භා.ස. /10,

බන්ධනාගාර මූලස්ථානය,

2010/10/ 29

සියළුම මාණ්ඩලික නිලධාරීන්,

සියළුම බන්ධනාගාර අධිකාරීන්,

සහකාර බන්ධනාගාර අධිකාරීන්,

## වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය - 2010 වර්ෂය.

## 2010 ජනවාරි 15 වන දිනට පෙර භෞතික පරීක්ෂණය සහ 2011 ජනවාරි 30 දිනට පෙර සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම.

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PF/FS/භා.ස./01 හා 2008/11/19 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 436 පරිදි වාර්ෂික ගබඩා භාණ්ඩ සමීක්ෂණය පහත පරිදි නිම කළ යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

1. 2011 ජනවාරි 10 දිනට පෙර භෞතිකව භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කිරීම.
2. 2011 ජනවාරි 31 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ලබා ගැනිම.
3. 2011 පෙබරවාරි 17 දිනට පෙර ඌණතා / අතිරික්ත සසදා වාර්තා කිරීම.
4. 2011 පෙබරවාරි 28 දිනට පෙර විනාශ කළ යුතු භාණ්ඩ විනාශ කිරීම, අළුත්වැඩියා කළයුතු භාණ්ඩ අළුත්වැඩියාව හා වෙන්දේසි කළ යුතු භාණ්ඩ වෙන්දේසි කර අවසන් කිරීම.
5. 2011 මාර්තු මස 17 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති හා 2006/07/30 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛ 422 අනුව රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් හා අනෙකුත් අදාල ආයතන වෙත වාර්තා කිරීම.

මෙයට අමතරව භාණ්ඩ සමීක්ෂණ කටයුතු සම්බන්ධයෙන් පහත සඳහන් කර ඇති ලිපි හා චක්‍රලේඛ පිළිබඳව ද දැඩි අවධානය යොමු කරන මෙන් කාරුණිකව දන්වමි.

- දෙපාර්තමේන්තු චක්‍රලේඛ - 2008/54 - 2008/12/04
- දෙපාර්තමේන්තු චක්‍රලේඛ - 2008/57 - 2008/12/24
- දෙපාර්තමේන්තු චක්‍රලේඛ - 2008/58 - 2008/12/24
- දෙපාර්තමේන්තු චක්‍රලේඛ - 2008/59 - 2008/12/24
- ලිපි - බ/12/08/වා.භා.ස./08 - 2008/12/04

තවද,

- 2010 වසර අවසන් වනතුරු නොසිට අදාල අකෘති පත්‍ර ලබාගෙන නොවැම්බර් හා දෙසැම්බර් මාසවලදී නිමකළහැකි සියළුම කටයුතු නිම කිරීමට අදාල උපදෙස් ලබා දෙන්න. සාමාන්‍ය වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයට අමතරව කාර්මික හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුමට අදාලව භාණ්ඩ සමීක්ෂණයේදී ද භාණ්ඩාගාර 66 ආකෘතියේ සම්පූර්ණ කර තිබිය යුතු වේ. තවද , සුබසාධන ගිණුමට අදාලව ආකෘති වෙනම සකස් කළයුතු වේ.
- පිටපත් 05 කින් සකස් කරන ලද භාණ්ඩාගාර 66 ආකෘතිපත්වලින් එක් පිටපතක් බන්ධනාගාර කොමසාරිස් (මුදල් ) වෙත 2011 ජනවාරි 05 වැනි දිනට පෙර යොමු කළ යුතුවේ.
- මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කළයුතු ආකාරය දැක්වෙන අමතර ලිඛිත උපදෙස් බන්ධනාගාර කොමසාරිස් (මුදල්) විසින් අවශ්‍ය අවස්ථාවන්හිදී අදාල නිළධාරීන්ට ලබා දීමට කටයුතු කළ යුතු වේ.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්